## වැඩිහිටි වන්දනා චාරිකා වෙනුවෙන් ආධාර ලබාදීම - 2025

### ❖ හැඳින්වීම

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් දිවයින පුරා පිහිටුවා පවත්වාගෙන යනු ලබන වැඩිහිටි සංවිධානවල වැඩිහිටියන් විසින් සිදුකරනු ලබන මෙහෙවර අගය කිරීම හා දිරිගැන්වීම සඳහා වැඩිහිටි සංවිධානගත වැඩිහිටියන් සඳහා ද, වැඩිහිටි නිවාසගත වැඩිහිටියන්ගේ අධ්‍යාත්මික හා මානසික සුවය වර්ධනය කිරීමේ අරමුණින් යුතුව, නිවාසගත වැඩිහිටියන් සඳහා ද, වන්දනා චාරිකා වෙනුවෙන් මූල්‍ය අනුග්‍රහය ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුකරනු ලබයි.

### අරමුණු

- රජයක් ලෙස වැඩිහිටි ප්‍රජාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන්ගේ අධ්‍යාත්මික සුවය වර්ධනය කිරීම
- හුදෙකලාභාවය අවම කරමින්, වැඩිහිටියන්හට කායික හා මානසික සුවයෙන් යුතු වැඩිහිටි වියක් අත්කර දීම
- වැඩිහිටි නිවාසගත වැඩිහිටියන් හා වැඩිහිටි සංවිධානගත වැඩිහිටියන් හට ක්‍රියාකාරි වැඩිහිටි දිවියක් අත්කර දීම

### ❖ ඉල්ලීම් ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක ක්‍රමවේදය

- **වැඩිහිටි සංවිධාන චාරිකා සඳහා**

2025 වර්ෂය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය හෝ ග්‍රාමීය වැඩිහිටි සංවිධාන සඳහා ආධාර ලබාදීමට නියමිත අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉල්ලීම් ලැබෙන පරිදි, ආධාර ලබාදීමට නියමිතය. 2025 වර්ෂයට අදාළ ඉල්ලීම් 2025.06.30 දිනට පෙර යොමුකළ යුතුය.

01. ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන වැඩිහිටි සංවිධානය (ග්‍රාමීය/ ප්‍රාදේශීය) ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි වියයුතු අතර, එම වැඩිහිටි සංවිධානයේ ලියාපදිංචි සහතිකයේ පිටපතක් හෝ මාණ්ඩලික නිලධාරියෙකුගේ අත්සනින් යුතු ලියාපදිංචි බවට ලිඛිත තහවුරුවක් ඉදිරිපත් කළ යුතුය.
02. අදාළ වැඩිහිටි සංවිධානය ක්‍රියාකාරීව පවත්වාගෙන යන බව හා සහභාගිවන වැඩිහිටියන් මීට පෙර වසර 03 ක් තුළ මේ යටතේ චාරිකාවට සහභාගී නොවූ වැඩිහිටියන් බව විෂය නිලධාරි විසින් වාර්තාකළ යුතුය.
03. වන්දනා චාරිකාවක් යාම සම්බන්ධයෙන් යෝජනා ස්ථිර කරගත් බව සඳහන් වන, රජයේ නිලධාරියෙක් විසින් සහතික කරන ලද වැඩිහිටි සංවිධානයේ මහා සභා හෝ මාසික සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කළ යුතුය.
04. වන්දනා චාරිකාව සඳහා සහභාගිවන වැඩිහිටියන්ගේ නාමලේඛණයක් ඉදිරිපත් කළයුතු අතර, ඒ සඳහා අවම වශයෙන් වැඩිහිටියන් **50 දෙනෙකු** වත් ඇතුළත් විය යුතුය.
05. චාරිකාව සඳහා ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩලය නමින් ඉල්ලීම් කරන්නේ නම්, මෙම වැඩසටහන යටතේ, පෙර අවස්ථා වලදී සහභාගී නොවූ වැඩිහිටියන් පමණක් සහභාගී කරවන බවට විෂය නිලධාරි විසින් ලිඛිත තහවුරුවක් ඉදිරිපත් කළයුතුය.

06. වන්දනා චාරිකාව යන ප්‍රදේශය හා ගමන් මාර්ගය ඇතුළත්, අදාළ වැඩිහිටි සංවිධානය විසින් ප්‍රාදේශීය ලේකම් වෙත යොමුකරන ලද ලිපිය, මාණ්ඩලික නිලධාරියෙකුගේ අනුමැතිය සහිතව ඉදිරිපත් කළ යුතුය.

07. වන්දනා චාරිකාවට අදාළ දළ ඇස්තමේන්තුව මාණ්ඩලික නිලධාරියෙකුගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

08. ඒ අනුව, ඉහත සඳහන් පරිදි අවශ්‍ය ලිපිලේඛණ හා පිරික්සුම් ලැයිස්තුව (Check list - ඇමුණුම - 02) සමග ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ ඉල්ලීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත්කළ යුතුය.

09. ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලා රු. 75,000/= ක උපරිමයකට යටත්ව ආධාර මුදල් ලබාදෙනු ලබන අතර, එම මුදල් වන්දනා චාරිකාවට අදාළව, ප්‍රාදේශීය ලේකම් විසින් හඳුනාගත් අවශ්‍යතා මත නිවැරදි ක්‍රමවේදයට අනුව වියදම්කළ හැකිය. එමෙන්ම, මේ යටතේ ලබාදෙන මුදල් අදාළ ලිත් වර්ෂය තුළම වියදම් කළයුතුය.

10. අදාළ මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබාදෙනු ලබන අතර, එම චෙක්පත සඳහා වන ලදුපත (පොදු 172 ආකෘතිය) කඩිනමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

11. අදාළ වන්දනා චාරිකාව අවසන් වූ පසු ඒ සම්බන්ධ වාර්තාව (ඡායාරූප සහිතව), ඇමුණුම- 04 මගින් කඩිනමින් ඉදිරිපත් කළයුතුය.

12. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබෙන ඉල්ලීම් අතුරින්, ප්‍රතිලාභී වැඩිහිටි සංවිධානය සඳහා ප්‍රමුඛතාව ලබාදීමේදී සලකා බැලියයුතු සාධක

- වැඩිහිටි සංවිධානය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කරන ලද දිනය
- සක්‍රීය සාමාජික සංඛ්‍යාව
- පසුගිය වසර 02 ක කාලය තුළ වැඩිහිටි සංවිධානය විසින් බාහිර සමාජය වෙනුවෙන් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්
- සමිතිය සතු මූල්‍ය ශක්‍යතාව (අඩු මූල්‍ය ශක්‍යතාවය සහිත සමිතිවලට වැඩි අවධානයක් ලබාදිය යුතුය.)
- සාමාජිකයින්ගේ ආර්ථික සුබසාධනය වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග
- ආදායම් උත්පාදන වැඩසටහන් /ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම
- වැඩිහිටි සංවිධානය ලබාගත් ප්‍රාදේශීය ජයග්‍රහණ
- නියමිත පරිදි රැස්වීම් වාර පැවැත්වීම හා නිලවරණ පැවැත්වීම
- මෙම වැඩසටහන සඳහා පළමුවරට ඉල්ලීම ඉදිරිපත් කිරීම

- **වැඩිහිටි නිවාස චාරිකා සඳහා**

දිස්ත්‍රික් ලේකම් බලප්‍රදේශ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසගත වැඩිහිටියන් වෙනුවෙන් සංවිධානය කරනු ලබන වන්දනා චාරිකා සඳහා ආධාර ලබාගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් ඉල්ලුම් කළ හැකිය. 2025 වර්ෂයට අදාළ ඉල්ලීම් 2025.06.30 දිනට පෙර යොමුකළ යුතුය.

01. අදාළ වැඩිහිටි නිවාසය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ලියාපදිංචි වැඩිහිටි නිවාසයක් විය යුතු අතර, ඒ සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක් (සහතික කරන ලද) ඉදිරිපත් කළයුතුය. එම නිවාස සඳහා ආධාර ලබාදීම සුදුසු බවට විෂය නිලධාරී විසින් නිර්දේශ කළ යුතුය.

02. යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස සංඛ්‍යාව හා ඒවායෙහි සිටින වැඩිහිටියන් සංඛ්‍යාව, එක් වන්දනා චාරිකාවක් සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවන් වලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් සම්බන්ධ කරමින් එක් චාරිකාවක් සංවිධානය කර, ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් මගින් ආධාර ඉල්ලීම් කළ හැකිය. මෙවැනි අවස්ථාවලදී මෙම ඉල්ලීම් සම්බන්ධ සියලුම සම්බන්ධීකරණ කටයුතු දිස්ත්‍රික් විෂය භාර නිලධාරී විසින් සිදුකළ යුතුය.

03. ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන වැඩිහිටි නිවාසය නොමිලේ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයක් වියයුතු අතර, ඒ බව ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් විසින් තහවුරු කළ යුතුය.

04. අවම වශයෙන් වැඩිහිටියන් **25 දෙනෙකුවත්** එක් චාරිකාවක් සඳහා සහභාගිවිය යුතු අතර, සහභාගිවන වැඩිහිටියන්ගේ නාමලේඛණයක් ඉදිරිපත් කළ යුතුය.

05. මෙම වැඩසටහන යටතේ ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී, මෙතෙක් වන්දනා චාරිකා වෙනුවෙන් ආධාර ලබා නොමැති වැඩිහිටි නිවාස සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතු අතර, කොට්ඨාසයේ එක් වැඩිහිටි නිවාසයක් පමණක් පවතින අවස්ථා වලදී වර්ෂ 03 ට වරක් නැවත ඉල්ලීම් කළ හැකිය. එවැනි අවස්ථා වලදී, මීට පෙර ආධාර ලබාගෙන ඇති වර්ෂය සඳහන්කළ යුතුය.

06. වැඩිහිටියන් විශාල පිරිසක් සිටින වැඩිහිටි නිවාස සඳහා වාර්ෂිකව ඉල්ලීම් කිරීමට හැකියාව ඇති අතර, පෙර වර්ෂවල සහභාගී නොවූ වැඩිහිටියන් සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතුය.

07. වන්දනා චාරිකාව යන ප්‍රදේශය, ගමන් මාර්ගය ඇතුළත් ඉල්ලීම් ලිපියක් අදාළ වැඩිහිටි නිවාසයේ **පාලක /පාලිකා** විසින් දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම ගමන් මාර්ගය හා ප්‍රදේශය මාණ්ඩලික නිලධාරියෙකු විසින් අනුමතකළ යුතුය.

08. වන්දනා චාරිකාව සඳහා වන දළ ඇස්තමේන්තුව අදාළ වැඩිහිටි නිවාසයේ පාලක/පාලිකාවගේ සම්බන්ධීකරණයෙන් යුතුව විෂය නිලධාරි විසින් සකස්කර මාණ්ඩලික නිලධාරියෙකුගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

09. ඒ අනුව, ඉහත සඳහන් පරිදි, අවශ්‍ය ලිපිලේඛණ හා පිරික්සුම් ලැයිස්තුව ද (Check list - ඇමුණුම -03) සමග අදාළ දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් විසින් මේ සඳහා වන ඉල්ලීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

10. ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලා රු. 75,000/- ක උපරිමයකට යටත්ව ආධාර මුදල් දිස්ත්‍රික් ලේකම් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදෙනු ලබන අතර, එම චෙක්පත සඳහා වන ලදුපත (පොදු 172 ආකෘතිය) කඩිනමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

11. එම මුදල් චාරිකාව වෙනුවෙන් අදාළව දිස්ත්‍රික් ලේකම් /ප්‍රාදේශීය ලේකම් විසින් හදුනාගත් අවශ්‍යතා මත නිවැරදි ක්‍රමවේදයට අනුව වියදම්කළ හැකිය. එමෙන්ම, මේ යටතේ ලබාදෙන මුදල් අදාළ ලිත් වර්ෂය තුළම වියදම් කළයුතුය.

12. අදාළ වන්දනා චාරිකාව අවසන් වූ පසු ඒ සම්බන්ධ, වැඩිහිටි නිවාසයේ **පාලකගේ/පාලිකාවගේ** සම්බන්ධීකරණයෙන් යුතුව විෂය නිලධාරි විසින් සකස්කර ප්‍රාදේශීය ලේකම්/ දිස්ත්‍රික් ලේකම් විසින් සහතික කරන ලද වියදම් වාර්තාව ඇමුණුම - 04 මගින් (ඡායාරූප සහිතව) කඩිනමින් මා වෙත ඉදිපත්කළ යුතුය.

කේ. චතුර මිහිඳුම්
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය